# 11 - ශ්‍රේණිය බුද්ධ ධර්මය
# තුන්වන වාර පරීක්ෂණය 2024
## පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| 01. 04 | 02. 02 | 03. 02 | 04. 01 | 05. 03 |
| 06. 01 | 07. 02 | 08. 04 | 09. 03 | 10. 03 |
| 11. 01 | 12. 03 | 13. 03 | 14. 03 | 15. 02 |
| 16. 01 | 17. 02 | 18. 02 | 19. 02 | 20. 01 |
| 21. 01 | 22. 02 | 23. 04 | 24. 02 | 25. 01 |
| 26. 03 | 27. 03 | 28. 03 | 29. 03 | 30. 02 |
| 31. 04 | 32. 02 | 33. 01 | 34. 01 | 35. 01 |
| 36. 02 | 37. 01 | 38. 02 | 39. 04 | 40. 02 |

### II පත්‍රය

01.

I. උපත - ලුම්බිණි සල් උයන
පරිනිර්වාණය - උපවත්තන සල් අයන

II. සමථ භාවනාව, විදර්ශනා භාවනාව

III.
- මහත් වූ බෝග සම්පත් අත්පත් කර ගැනීම.
- කීර්තිය පැතිරීම.
- ඕනෑම පිරිසක් මැදට නිර්භය ව එළඹීමට හැකිවීම.
- සිහිමුලා නොවී කලුරිය කිරීම.
- මරණින් මතු සුගතියක උපත ලැබීම.

IV. උට්ඨාන සම්පදා, ආරක්ඛ සම්පදා, කල්‍යාණ මිත්තතා, සමජීවිකතා

V. ලොව පවත්නා බලවත්ම රෝගය කුසගින්නයි.

VI. ශාරීරික, උද්දේසික, පාරිභෝගික

VII. අමාවතුර - පොළොන්නරු යුගය
ථූපවංශය - දඹදෙනි යුගය

VIII. දානය :- රටවැසියාගේ ආර්ථික සුරක්ෂිතතාව තහවුරු කරලීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය ලබාදීම දානය යි. එනම් දැහැමි ජීවන වෘත්තියක් ආරම්භ කොට ක්‍රියාත්මක කරගෙන යාමටත් ජනතාව වෙනුවෙන් සුභසාධක සේවා පවත්වා ගෙන යාමටත් අවශ්‍ය පහසුකම් සැලසීම දානය යි.
පරිත්‍යාගය :- පාලකයා විසින් රට වැසියාගේ යහපත සඳහා තම කාලය, දනය, ශ්‍රමය, සුවපහසුව, කැපකිරීම පරිත්‍යාගය යි.

IX. පළමුවන වස්කාලය - වේළුවන උයන
දහවන වස්කාලය - පාරිලෙය්‍යක වනයෙහි

X. බුදුරජාණන් වහන්සේ සියලු කෙලෙසුන්ගෙන් දුරු වූ හෙයින් ද, රහසින් වත් පව් නොකළ හෙයින් ද සියලූ පූජාවන් ලැබීමට සුදුසු වූ හෙයින් ද "අරහං" නම් වන සේක.

02.

I. බුද්ධකාරක ධර්ම/බුදු කුරු දම්

II. පාරමී, උප පාරමී, පරමත්ථ පාරමී

III. සසර සයුරින් එතෙරවීමට සම්පූර්ණ කරන වටිනා ගුණධර්ම දහයක් පිළිබඳව බුදු දහමෙහි ඉගැන්වේ. මේවා පූර්ණය කිරීමෙන් පුද්ගලයා තුළ මනා සංවර්ධනයක් ඇතිවේ. නිර්වාණාවබෝධය අපේක්ෂා කරන උතුමෝ දානය නැමැති ගුණධර්ම දියුණු කිරීමට තමන් සතු වස්තුව කෙරෙහි ලෝභය මද කුදු ඉතිරි කර නොගෙන අන්‍යයන්ගේ යහපත වෙනුවෙන් කැප කරති. ටිකෙන් ටික පුහුණු කරගත යුතු ගුණධර්මයකි. ඒ තුළින් ලෝභයෙන්, ද්වේශයෙන් තොරව මෛත්‍රී සහගත සිතිවිලි වර්ධනය කර ගැනීමට හැකියාව ලැබේ. දෙවනුව කය වචනය සංවර කර ගැනීමෙන් අනුන්ගේ ජීවිත දේපළ ආරක්ෂා කරයි අන් අය හා සහයෝගයෙන් ජීවත් වීමට මෙය උපකාරී වෙයි. මේ ආකාරයෙන් පාරමිතා ගුණධර්ම තුනක් වත් උදාහරණයට ගෙන පුද්ගල සංවර්ධනයට අදාළ කරුණු තහවුරු කරමින් පිළිතුරු ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. (11 ශ්‍රේණිය 3 පාඩම පරිශීලනය කරන්න.)

03.

I. තංච කම්මං කතං සාධු
යං කත්වා නානුතප්පති
යස්ස පතීතො සුමනෝ
විපාකං පටිසේවති

II. යමක් කිරීමෙන් පසුතැවෙන්නට සිදු නොවේ ද යමක විපාකය ප්‍රීතියෙන් හා සොම්නසින් යුතු ව විඳිය හැකි වේ ද එබඳු ක්‍රියාවල නිරත විය යුතු ය.

III. සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් ධම්මපදය ගාථා 423 ක් හා වග්ග 26 කින් යුක්තය. බාල මහළු ලොකු කුඩා සියලූ දෙනාට පරිහරණය කළ හැකි වටිනා උපදෙස් ග්‍රන්ථයක් වන ධම්මපදය පුද්ගල ජීවිතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය උපදෙස් ඇතුලත් ය. ජාති ආගම් භේදයකින් තොරව සමස්ථ මානව වර්ගයාටම ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය හැකි ධර්ම කරුණු අඩංගුය........ නිදසුන් තුනක්වත් දක්වමින් පිළිතුර ගලපා තිබේ නම් පිළිතුර සමස්ථයක් සේ සලකා ලකුණු දෙන්න.

04.

I. අරියපරියේසන සූත්‍රය

II. **භික්ෂූන් වහන්සේලාට ජලය පරිහරණය කිරීම පිළිබඳ පනවා ඇති විනය නීති**

- ජලයට මළ මූත්‍රා කිරීම, කෙළ ගැසීම, වමනය කිරීම,
- ජලය පෙරා පාවිච්චි කිරීම, පෙරහන්කඩ නිර්දේශ කිරීම,

**තුරුලතා ආරක්ෂා කිරීම පිළිබඳ විනය නීති**

- උපසසන් භික්ෂූන් වහන්සේලාට තණකොළ ගසක්වත් කැපීම අයහපත් ධර්මයක් ලෙස නිර්දේශ කිරීම,
- දිවා රැය වැඩෙන පින්කම් පිළිබඳ වනරෝග සූත්‍රයේ සඳහන් තොරතුරු

**ශබ්ද දූෂණය පිළිබඳ ලබාදී ඇති විනය නීති**

- අනවශ්‍ය ලෙසින් උස් හඬින් කතා කරන, ප්‍රලාපයන්හි යෙදෙන මිනිසුන් සිටින තැන්වලට වැඩම කිරීම ප්‍රතික්ෂේප කිරීම...... පරිසර සුරක්ෂිතතාව සම්බන්ධයෙන් බුදුරදුන් අගය කළ කුමන හෝ කරුණු තුනක් ඇත්නම් ලකුණු ලබා දෙන්න.

III.

- ජීව අජීව පරිසරයට අයත් මිනිසා ඇතුළු සියලූ සතුන් මෙන්ම නොමැරුණු තුරුලතා හා හිරු සඳු අහස පොළොව .... ආදී අජීවී වස්තු සියල්ලම පරිසරය වැදගත් කොටස්කරුවෝ බව
- බුදුසිරිතේ සෑම වැදගත් අවස්ථාවක්ම පරිසරය හා සම්බන්ධ බව (උපත, සත්‍ය ගවේෂණය, බුදුවීම, ප්‍රථම ධර්ම දේශනය, වස්කාල ගත කිරීම, බොහෝ සූත්‍රාගත ධර්ම දේශනා පැවැත්වූ ස්ථාන හා පරිනිර්වාණය)
- පරිසරයේ ඇති වැදගත්කම තහවුරු කර තිබීම හා එය ආරක්ෂා කිරීමට කටයුතු කරන ආකාරය දක්වා තිබෙන පිළිතුරට සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

05.

I. පැවැත්වූ ස්ථානය - මාතලේ අළු විහාරය
රාජ්‍ය සමය - වළගම්බා රාජ්‍ය සමය

II.

- වළගම්බා රජු ප්‍රති උපකාරයක් වශයෙන් අභයගිරිය කරවා පූජා කිරීමත්, සමගාමීව ඇති වූ ශාසන අර්බුදයෙන් බුදු සසුන බේරා ගැනීමට මහා විහාරය භික්ෂූන් ඉදිරිපත් වීම.
- බැමිණිතියා නම් සාගතය නිසා භික්ෂූන් වහන්සේලාට අත් වූ ඉරණම
- දීර්ඝ කාලීන යුද වාතාවරණයන් සමඟ ත්‍රිපිටක ධර්මයේ සුරක්ෂිතතාවට ගැටළු ඇතිවීම
- ලක්දිව ඇතැම් භික්ෂූන් වහන්සේ ශාසනික පිළිවෙත් වලින් බැහැරවීම
- ත්‍රිපිටකය ලේඛනාරූඪ කිරීමේ බලවත් අවශ්‍යතාවය ආදී කරුණු වලින් තුනක්

III. බුදු දහමේ චිර පැවැත්ම උදෙසා භික්ෂු විනය ප්‍රමුඛ වීම වැදගත් කරුණකි. ඒ සඳහා උගත් තෙරුන් වහන්සේලා බුදු සසුනේ අර්බුදකාරී තත්ත්වයක් ඇතිවන විට එක් රැස්ව බුද්ධ දේශනාවත්, ශාසනයත් ආරක්ෂා කර ගැනීමේ අරමුණින් පැවැත්වූ සංගායනා අතරින් හතරවන අළු විහාර ධර්ම සංගීතයයි. වළගම්බා රාජ්‍ය සමය වන විට ඇතිවූ යුද වාතාවරණයත්, බැමිණිතියා සාගතයන් නිසා භික්ෂූන් කට පාඩමින් ධර්මය පවත්වාගෙන යාම අනතුරේ බවත් දුටු මහා විහාරියේ තෙරුන් බුදු සසුනේ චිරස්ථිතිය වෙනුවෙන් කළ කැපකිරීමත් එමගින් ලැබූ ප්‍රතිඵලත් විස්තර කර තිබෙන පිළිතුර සමස්ථයක් සේ සලකා ලකුණු ලබාදෙන්න

06.

I. නිරෝගී බව උතුම්ම ලාභය යි.

II.

- රෝගාබාධ අඩු බව
- නිදුක් බව
- සැහැල්ලූ පැවැත්ම
- කාය බලය
- සුවපහසු පැවැත්ම මේවා අතරින් තුනක්

III. මානසික නිරෝගී භාවය සඳහා භාවනාව නිර්දේශ බවත්, භාවනාව සඳහා කායිකව නිරෝගී බව අත්‍යවශ කරුණක් බවත්, ඒ සඳහා බලපාන ප්‍රධාන සාධක දැහැමි පිළිවෙත් නිවැරදි ජීවන පුරුදු නිවැරදි ඉරියව් පවත්වා පවත්වා ගැනීම මෙන්ම වැදගත් බව දක්වා තිබීම. තමා ජීවත්වන පරිසරය පවිත්‍රව තබා ගැනීම ආයු වර්ණ සැප බල ලැබෙන ආහාර රට හා පුරුදු ඇති කර ගැනීම වර්තමානයේ බහුලව දක්නට ලැබෙන දියවැඩියාව අධිරුධිර පීඩනය මේද අධික බව අවිධිමත් ආහාර පුරුදු බලපාන බවත් නිරෝගී සිරුරක් සඳහා විධිමත් ආහාර පුරුදු තෙල් සීනි ලූණු බහුල ආහාර අඩු කිරීම නියමිත වේලාවකට ආහාර ගැනීමට පුරුදුවීම ආදී විසඳුම් ඉදිරිපත් කර පිළිතුරට සම්පූර්ණ ලකුණු ලබාදෙන්න

07.

I. **අනගාරික ධර්මපාල තුමා**

දොන් ඩේවිඩ් කුමරුගේ උපත, දෙමාපියන්, මූලික අධ්‍යාපනය, ඕල්කට් තුමාගේ හමුවීම, නම වෙනස් කිරීම ආදී මූලික තොරතුරු බුද්ධ ශාසනයට සිදුකළ සේවාවන්, පැවිදි උපසම්පදාව ලැබූ අයුරු දක්වා තිබීම.(11 ශ්‍රේණිය පෙළ පොතේ 5 පාඩම බලන්න.)

II. **සඳකඩ පහන**

- බෞද්ධ සිද්ධස්ථානයකට හෝ රාජකීය ගොඩ නැගිල්ලකට පිවිසෙන පියගැට පෙළ පාමුල පිහිටි අර්ධකවාකාර ගල්පුවරුව බව
- කලාත්මකම නිර්මාණය අනුරාධපුර බිසෝමාලිගාව අසල ඇති බව
- විසිතුරු කැටයම් හා එම කැටයම් වලින් සංසාර චක්‍රය පෙන්වන බව විද්වතුන් දක්වා ඇති බව
- අනුරාධපුර හා පොලොන්නරු සඳකඩපහනෙහි වෙනස්කම් ඇති බව.... ආදී කරුණු ඇතුලත් විය යුතුයි.

(10 ශ්‍රේණිය 20 පාඩම පරිශීලනය කරන්න. පිළිතුර සමස්ථයක් සේ සලකා ලකුණු දෙන්න.)

III. **සම්මා කම්මන්ත**

ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සීල කොටසට අයත්ය. යහපත් කායික ක්‍රියා සම්මා කම්මන්ත යයි. ලෝභ දෝශ මෝහ මූලික කරගත් කායික විසමාචාර වන පරපණ නැසීම, සොරකම, වැරදි කාමසේවනය, ආදියෙන් වැළකී ජීව අජීවි පරිසරයට ආදරය කිරීම, ආරක්ෂා කිරීම, අන්‍යයන්ගේද දේපොළ වස්තු ආරක්ෂා කිරීම, පවුල් ඒකකය ආරක්ෂා කර ගනිමින් සමාජ සම්මත ක්‍රියාකාරකම්වල යෙදීම සම්මා කම්මන්තයයි.

IV. **සතර බ්‍රහ්ම විහරණ**

**චතු** අප්පමඤ්ඤා හෙවත් උතුම් හැසිරීම් යන අර්ථයෙන් සතර බ්‍රහ්ම විහරණ ගුණ ගරුක පුද්ගලයෙක් නිර්මාණය කිරීම හඳුන්වා දී ඇත. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන මේවා පුද්ගල ජීවිතය සරු කරන ධර්ම කරුණු බවත්, එබැවින් ඒවා පුද්ගල ජීවිතයට එකතු කරගැනීමේ වටිනාකම පිළිබඳ පිළිතුර ගලපා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.